# අළුත් බෝතල්වල එන පරණ වයින් :

## නව ලිබරල්වාදී යුගයේ පැරණි ඒකාධිපතිත්වයේ නැවත පැමිණීම

විදුර ප්‍රභාත් මුණසිංහ
ඉෂාන් චාමර බටවලගේ



නීතිය හා සමාජ භාරය

# අළුත් බෝතල්වල එන පරණ වයින් :
## නව ලිබරල්වාදී යුගයේ පැරණි ඒකාධිපතිත්වයේ නැවත පැමිණීම

මාර්තු, 2019

**අළුත් බෝතල්වල එන පරණ වයින් :**
**නව ලිබරල්වාදී යුගයේ පැරණි ඒකාධිපතිත්වයේ නැවත පැමිණීම**

**© නීතිය හා සමාජ භාරය, 2019**
ISBN 978-955-1302-80-1

මෙම පඨිතයේ අන්තර්ගතය හෝ එහි කොටස් වාණිජ්‍යය නොවන පරමාර්ථයන් සඳහා පමණක් උපුටා ගැනීම හා පිටපත් කිරීමට ලේඛනය හා එහි ප්‍රකාශක නියමාකාරයෙන් හඳුන්වා දීමෙන් අනතුරුව සිදු කිරීමට අවසර ඇත.

**විදුර ප්‍රභාත් මුණසිංහ**
ඉෂාන් චාමර බටවලගේ

කවරය හා පිටු සැකසුම : ප්‍රභාත් හේමන්ත කුමාර

ප්‍රකාශක :

**නීතිය හා සමාජ භාරය**
3, කින්සි ටෙරසය,
කොළඹ 00800,
ශ්‍රී ලංකාව
දුරකථනය : +94 (0) 11 268 48 45
ෆැක්ස් : +94 (0) 11 268 68 43
වෙබ් : www.lstlanka.org

# අළුත් බෝතල්වල එන පරණ වයින් :
## නව ලිබරල්වාදී යුගයේ පැරණි ඒකාධිපතිත්වයේ නැවත පැමිණීම[1]

විදුර ප්‍රභාත් මුණසිංහ[2]
ඉෂාන් චාමර බටවලගේ[3]

### හැඳින්වීම

ලන්ඩන් ස්කූල් ඔෆ් ඉකොනොමික්ස් හි 'ජනප්‍රියවාදී යුගයේ මානව හිමිකම්' යන හිසින් යුතු දේශනයක් කරමින් උග්‍ර දරිද්‍රතාවය සහ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතවරයා වන පිලිප් ඇල්ස්ටන් මෙසේ පවසයි.

> "අද දවසේ මානව හිමිකම් ව්‍යාපාරය මුහුණදෙන අභියෝගයන් අතීතයේ එය මුහුණදුන් අභියෝගයන්ට වඩා මූලධාර්මිකව වෙනස් ය. නමුත් මා එසේ පවසන විට, ශාස්ත්‍රාලීය විද්වතුන් අපට කියා සිටින්නාක් මෙන් මානව හිමිකම් ව්‍යාපාරයේ ලිබරල් ප්‍රභූ සමාගමය හේතුකොටගෙන එය බෙහෙවින්ම හීලෑ වී තවදුරටත් ජනප්‍රියවාදයට එරෙහිව තරඟ කිරීමට නොහැකි තත්ත්වයට පත්ව, එසේත් නැතිනම් අප 'පශ්චාත් මානව හිමිකම් යුගය'කට එළැඹ ඇතැයි යන්න අදහස් නොවේ. එමෙන්ම අප සම්පූර්ණයෙන්ම මානව හිමිකම්

---

1. මෙම පත්‍රිකාවේ අන්තර්ගත අදහස් මෙහි කතුවරුන්ගේ අදහස් වන අතර නීතිය හා සමාජ භාරයේ හෝ එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස්වල නියෝජනයක් නොවේ.

2. විදුර ප්‍රභාත් මුණසිංහ නීතිය හා සමාජ භාරයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂකයකු වශයෙන් කටයුතු කරයි.

3. ඉෂාන් චාමර බටවලගේ නීතිය හා සමාජ භාරයේ පර්යේෂණ සහායකයකු වශයෙන් කටයුතු කරයි.

> පිළිබඳව වන අපේක්ෂාවන් අත්හැර අපට හුරුපුරුදු පැරණි ඒකාධිපතිත්වයන් හා බැඳුණු වර්තමාන ජනප්‍රියවාදය විසින් අභිමුඛ කරන අභියෝගයන්ට මුහුණ දීම පිණිස නව මෙවලම් සොයා යා යුතු බවක් ද මම අදහස් නොකරමි".[4]

ඔහු පෙන්වා දෙන ආකාරයට මෙකී ජනප්‍රියවාදී අභියෝගය සුජාතකරණය කෙරෙන්නේ ප්‍රධාන කොටම ජාතික ආරක්ෂාව, ස්වාධිපත්‍යය සහ ආර්ථික ජාතිකවාදය පදනම් කරගනිමිනි[5]. වර්තමානයේ ජනප්‍රියවාදී ලෝක දේශපාලන නායකයින් වන ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප්, ඉන්දියාවේ අගමැති නරේන්ද්‍ර සිං මෝදි, පිලිපීනයේ රෝඩ්රිගෝ දුතාර්තේ, බ්‍රසීලයේ ජනාධිපති ජයිර් මිසියස් බොල්සොනාර්, පෝලන්තයේ ජනාධිපති අද්‍රෙයි දුදා, හංගේරියාවේ ජනාධිපති යානොස් ඇඩර් වැන්නවුන් වෙතින් ප්‍රකාශමාන වන්නේ මේ ජනප්‍රියවාදී තර්කයන් ය. බ්රෙක්සිට් (Braxit) වැනි සංසිද්ධීන් හිදී ද ඉදිරිපත් වූයේද මෙම තර්කයන්මය.[6] ඇල්ස්ටන්ට අනුව වර්තමානයේ අන්තර්ජාතික මානව හිමිකම් පද්ධතියේ මූලික කුළුණු ප්‍රකාශිතවම අභියෝගයට ලක්කිරීමේ අභිලාෂයන් සහිත රජයන්ගෙන් සමන්විත බලවත් හා ශක්ති සම්පන්න එකතුන් නිර්මාණය වෙමින් පවතී.[7] මෙවැනි මානව හිමිකම් අභියෝගයට ලක් කරන එකතුන් නිර්මාණයවීම ඉතිහාසය පුරාම සිදුව ඇති නමුත් එක්සත් ජනපදය හා ලතින් ඇමරිකානු

---

4. පිලිප් ඇල්ස්ටන්. "The Populist Challenge to Human Rights." Journal of Human Rights Practice, 9 වෙළුමල 1 කලාපය, (2017): 1–15.

5. එම.

6. තිමොති බී. ලී. "Brexit: the 7 most important arguments for Britain to leave the EU,"www.vox.com, ප්‍රවේශය නොවැම්බර් 15, 2018, https://www.vox.com/2016/6/22/11992106/brexit-arguments.

7. පිලිප් ඇල්ස්ටන්. "The Populist Challenge to Human Rights." Journal of Human Rights Practice, 9 වෙළුමල 1 කලාපය, (2017): 1–15.

ආණ්ඩු විසින් ඊට එරෙහිව ශක්තිමත්ව කටයුතු කර තිබේ (මේ ක්‍රියාකාරීත්වය නිර්දේශපාලනික හුදෙක් මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් සිදුකරන ලද්දක් නොවන බව පැහැදිලිය). නමුත් මෙවර මේ අභියෝගයන් එල්ල වන්නේ කලින් මෙහි ආරක්ෂකයින් ලෙස පෙනී සිටි කඳවුර තුළින්මය.

මානව හිමිකම් සංවර්ධනයට බාධාවක් වන්නේය යන තර්කය ශ්‍රී ලංකාවේද රාජ්‍ය හා පුද්ගලික යන දෙඅංශය තුළින්ම අසන්නට ලැබෙන්නකි.[8] ශ්‍රී ලංකාව තුළ මෑත කාළයේ සිදුවූ වැදගත් කම්කරු අරගල ත්‍රිත්වයක් (ටෙලිකොම් මෑන් පවර් වැඩ වර්ජනය, රුහුණු මාගම්පුර මෑන් පවර් අරගලය සහ රත්මලාන ඇසෝසියේටඩ් බැටරි මැනුෆැක්චරස් (Associated Battery Manufactures-ABM) වැඩ වර්ජනය) සලකා බලමින් ඉහත කී අයිතිවාසිකම් පිළිබඳ ගැටලුකාරී තර්කයන්ට පදනම සපයන ආර්ථික මොඩලය පිළිබඳවත්, එකී ආර්ථික මොඩලය හා වර්තමාන මානව හිමිකම් විරෝධී ජනප්‍රියවාදී කතිකාව අතර පවත්නා සම්බන්ධය පිළිබඳත් විමර්ෂණය කිරීම මෙම ලිවීමේ අරමුණයි.

මෙහිදී අපගේ අවධානයට බඳුන් වන කම්කරු අරගල ත්‍රිත්වයේ එක් පොදු ලක්ෂණයක් වෙයි. එනම් මිනිස් බල සැපයුම් සමාගම් හෙවත් මෑන් පවර් සමාගම් යනුවෙන් පොදු ව්‍යවහාරයේ හඳුන්වනු ලබන තුන් වන පාර්ශ්වයක් වෙතින් මිනිස් බලය කුලී පදනම වෙත ලබාගැනීමේ පරිචය හා එකී සමාගම්වල ක්‍රියාකාරීත්වය මෙම අරගල ත්‍රිත්වයේම පදනම වීමයි. එබැවින් ඉහත කී අරගල ත්‍රිත්වය පිළිබඳව වැඩිදුර විමසා බැලීමට පෙර මිනිස් බල සැපයුම් සිදුකරනු ලබන

8. රාධිකා කුමාරස්වාමි. "International Human Rights: Dispelling the Myths," https://groundviews.org, ප්‍රවේශය නොවැම්බර් 15, 2018. https://groundviews.org/2014/08/28/international-human-rights-dispelling-the-myths-by-radhika-coomaraswamy/

තුන්වන පාර්ශ්වයන් වෙතින් මිනිස් බලය කුලියට ලබාගැනීමේ පරිචයේ ඓතිහාසික විකාශනය පිළිබඳව මඳකට අපගේ අවධානය යොමු කිරීම වැදගත්ය.

## ශ්‍රමය සම්බන්ධයෙන් වන සුසමාදර්ශී විතැන්වීමක්?

ශ්‍රී ලංකාව තුළ ප්‍රථමවරට මිනිස්බල සැපයුම් ආයතන හඳුනාගත හැකි වන්නේ 1980 දශකය මුල් භාගයේදී, එනම් මෙරට විවෘත ආර්ථිකය ක්‍රියාත්මක වීම ආරම්භ වූ මුල් වකවානුවේ සිටමය.[9] වර්තමානය වන විට පුද්ගලික ආයතන මෙන්ම බොහොමයක් රාජ්‍ය ආයතන ද තමන්ගේ ශ්‍රම අවශ්‍යතාවයන් මෙම මිනිස් බල සැපයුම් ආයතන හරහා සපුරා ගනී. නූතන කාර්මික ධනවාදී සමාජයන්හි කර්මාන්තශාලා ආකෘතිය තුළ පැවැති සේව්‍ය-සේවක සම්බන්ධතා ආකෘතිය[10] මෙකී මිනිස් බල සැපයුම් සමාගම්වල පැමිණීමත් සමඟ වඩාත් සංකීර්ණ තත්ත්වයකට පත්විය. ඉහත කී මිනිස් බල සැපයුම් සමාගම් මෙම ශ්‍රම සබඳතාවයට තුන් වන පාර්ශ්වයක් ලෙස මැදිහත් වෙමින් නව සංකීර්ණතාවයන් නිර්මාණය කරන ලදී.[11] මෙම නව සේව්‍ය-සේවක සබඳතා මාදිලියට පදනම සැකසූයේ 1960 දශකයේදී කේන්සියානු ආර්ථික මොඩලය මුහුණදුන් අභියෝගයන් ය.[12] මේ යටතේ, සේව්‍ය-සේවක සබඳතාවන්හි අනම්‍යශීලී බව, රාජ්‍ය වෙත පැවරී තිබූ සමාජ

---

9. විදුර මුණසිංහ. Reimagining ‘The Worker’ and Resistance in the Neo-Liberal Era (Colombo: Law & Society Trust, 2018), 13.

10. නූතන කර්මාන්තශාලා පලමු වරට බිහිවූ මුල්කාලීන කාර්මික ධනවාදී සමාජයන්හි බිහිවූ රැකියා ස්වරූපය කර්මාන්තශාලා පරිපාලනයේ දෘඩි ධූරාවලිගත පාලනයට යටත් වූ නිශ්චිත, පූර්ණ කාලීන, වැටුප් ලබන රැකියා විය. (Edgell, Stephen. Sociology of Work: Continuity and Change in Paid and Unpaid Work (London: Sage Publications, 2006), 1-27).

11. එම.

12. David Harvey. Spaces of Neo-Liberalism: Towards a Theory of Uneven Geographical Development. Hettner Lecture 2004, Franz Steiner Verlag, 2005. https://d-nb.info/974905585/04

ආරක්ෂණ වගකීම සහ ශ්‍රම බලකාය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවිධානාත්මක වෘත්තීය සමිති ක්‍රියාමාර්ග යනාදිය ආර්ථිකයට අභියෝගයන් ලෙස වටහා ගන්නා ලදී. මේ අනුව වෙළඳපොලට සිදු කරන රාජ්‍ය මැදිහත්වීම හැකි අවම මට්ටමකට සීමා කළ යුතු යන අදහස ඉදිරිපත් වන්නේ වෙළඳපොල සංඥා (මිළ ගණන්) අනුමාන කිරීමට තරම් ප්‍රමාණවත් තොරතුරු ප්‍රමාණයක් තමන් සතු කර ගැනීමට රාජ්‍යයට කිසිසේත්ම හැකියාවක් නොමැතිය යන තර්කනය මත පිහිටාය. මෙහිදී ශ්‍රම ක්‍රියාවලීන්, ශ්‍රම වෙළඳපොලවල්, භාණ්ඩ හා පරිභෝජන රටාවන් විශාල ලෙස වෙනස්කම්වලට භාජනය කෙරුනේ ඒවා වඩ වඩාත් නම්‍යශීලී බවට පත්කරනු පිණිසය[13]. ශක්තිමත් පුද්ගලික දේපල අයිතීන්, නිදහස් වෙළඳපොලවල් සහ නිදහස් වෙළඳාම යන අංග වලින් හැඩගැස්වුණු ආයතනගත රාමුවක් යටතේ පුද්ගලයින්ගේ ව්‍යවසායික නිදහසට විමුක්තිය ලබා දීමෙන් මිනිසාගේ යහපත වැඩි දියුණු කළ හැකිය යන්න විශ්වාසය මත පදනම්වූ මෙම වැඩපිලිවෙල එක්තරා ආකාරය වෙළඳපොළ මූලධර්මවාදයකි. අද නවලිබරල්වාදය ලෙසින් අප හඳුනාගන්නේ මෙම දේශපාලන - ආර්ථික වැඩපිළිවෙළයි. 'නම්‍යශීලී සංකේන්ද්‍රණය' මත පදනම්වූ මෙම වෙළඳපොළ මූලධර්මවාදයේ අත්‍යාවශ්‍ය අංගයක් වූයේ ශ්‍රම වෙළඳපොළ නියාමනහරණය යි.[14] මෙරට තුළ විවෘත ආර්ථිකය හඳුන්වාදීමත් සමඟ මෙම නියාමනහරණ ක්‍රියාවලිය ආරම්භ වූ අතර එතැන් සිට ගතවූ දශක හතරක කාලය පුරාවටම එය එය ප්‍රධාන ආකාර තුනකින් ක්‍රියාත්මක විය.

1. කම්කරුවන්ට අහිතකර ධනේෂ්වර හිතවාදී නීති ප්‍රතිපාදන සහ ප්‍රතිපත්තිමය මැදිහත් වීම් සිදු කිරීම.

13. David Harvey, A Brief History of Neo-Liberalism, (Oxford: Oxford University Press, 2006), 76.

14. එම.

2. කම්කරුවා ස්ථිර සේවා ගිවිසුම් වලින් බැඳුණු ශ්‍රම බලකායෙන් බැහැර කරවමින් ශ්‍රමික අනන්‍යතාවය සංකීර්ණ කරවන විවිධාකාරයේ ශ්‍රම සැකසුම් හඳුන්වා දීම තුළින් සේවා යෝජකයාට සේවකයා සම්බන්ධ වගකීම් වලින් මිදීමට අවකාශය සලසා දීම.

3. වෘත්තීය සමිති ව්‍යාපාරය දුර්වල කිරීම.[15]

දැන් අපට නවලිබරල් ආර්ථිකය තුළ ශ්‍රම වෙළඳපොල නියාමනහරණය නම් පර්යාවලෝකය ඇසුරින් ඉහත සඳහන් කළ (තෙවන පාර්ශ්වයේ මිනිස් බල සැපයුම් සමාගම් වෙතින් මිනිස් ශ්‍රමය කුලියට ලබාගැනීමේ පරිචය හේතුවෙන් නිර්මාණය වූ) කම්කරු අරගල ත්‍රිත්වය විමසා බැලිය හැක.

## අරගල ත්‍රිත්වයක්

ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය 1988 තරම් ඈත කාලයක සිට මෑන්පවර් පදනම යටතේ සේවකයින් බඳවා ගන්නා ලදී.[16] මුල් කාලීනව ප්‍රකට මෑන්පවර් සමාගම් ඔස්සේ මෙම සේවය සම්පාදනය කරගනු ලැබූ අතර 2008 කාලයේදී ශ්‍රී ලංකා ටෙලිකොම් මෑන්පවර් සොලියුෂන්ස් (Sri Lanka Telecom Manpower Solutions) නම් වූ ටෙලිකොම් ආයතනයට අනුබද්ධ සමාගමක් නිර්මාණය කරමින් ඒ ඔස්සේ ටෙලිකොම් සමාගමට අවශ්‍ය ශ්‍රමය සම්පාදනය කරගැනීම ආරම්භ කරන ලදී.[17] පසුකාලීනව මෙම ටෙලිකොම් මෑන්පවර් සොලියුෂන්ස්

15. Vidura Munasinghe, Reimagining 'The Worker' and Resistance in the Neo-Liberal Era (Colombo: Law & Society Trust, 2018), 12.

16. ටෙලිකොම් ආයතනයේ ශ්‍රම අවශ්‍යතාවයෙන් 100% ක් බැහැරින් ලබා නොගැනින. තෙවන පාර්ශ්වයේ මිනිස්බල සැපයුම් සමාගම් වෙතින් ලබාගනු ලැබූයේ ශ්‍රම අවශ්‍යතාවයෙන් කොටසක් පමණි. මෙතුළින් ටෙලිකොම් ආයතනය තුළ සේවකයින් වර්ග දෙකක් (ටෙලිකොම් සේවකයින් හා මෑන් පවර් සේවකයින්) බිහිවිය. ආයතන දෙකකින් බඳවා ගනු ලැබූවද බොහෝ විට මේ සේවක දෙකොට්ඨාශයම විසින් ඉටු කළේ එක හා සමාන කාර්යයන් ය.

17. ගුරුසිංහ, සම්මුඛ සාකච්ඡාව, අගෝස්තු 15, 2018.

සමාගම එස්එල්ටී හියුමන් කැපිටල් සොලියුෂන්ස් (SLT Human Capital Solutions) නමින් නම වෙනස් කරුනු ලැබූවත් තවදුරටත් හිමිකාරත්වය 100% ක්ම ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙතම පැවතුනි.[18] මේ අනුව ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය තුළ කාණ්ඩ දෙකකට අයත් සේවකයෝ සේවය කරති. එනම්, ස්ථිර ටෙලිකොම් (ඍජුවම ශ්‍රී ලංකා ටෙලිකොම් වෙත බඳවා ගනු ලැබූ) සේවකයින් සහ එස්එල්ටී හියුමන් කැපිටල් සොලියුෂන්ස් වෙත බඳවා ගනු ලැබූ සේවකයින් ලෙසය.[19] ශ්‍රී ලංකා ටෙලිකොම් ස්ථිර සේවකයින්ට ඉහළ වැටුපක්, ප්‍රසාද දීමනා, රැකියා ස්ථිරතාවය ඇතුළු සියලු වරප්‍රසාද හිමිවන අතර එම කාර්යයම ඉටු කරන මැන්පවර් සේවකයෙකුට (එස්එල්ටී හියුමන් කැපිටල් සොලියුෂන්ස් සේවකයෙකුට) රැකියා ස්ථිරතාවය සහ අනෙකුත් වරප්‍රසාද නොමැතිවනවා පමණක් නොව ඔවුන්ගේ වැටුප ද ටෙලිකොම් ස්ථිර සේවකයෙකුගේ වැටුපෙන් 1/3 පමණක්[20] වේ.

රුහුණු මාගම්පුර වරායේදී සිදු ව තිබුණේ එහි ආරම්භක අවස්ථාවේදීම වරාය සේවකයින් වරාය අධිකාරිය වෙත නොව මාගම්පුර

---

18. Sri Lanka Telecom, http://slt.lk, ප්‍රවේශය, නොවැම්බර් 11, 2018, http://www.slt.lk/en/about-us/profile/subsidaries.

19. ටෙලිකොම් ස්ථිර සේවකයින් සහ මැන්පවර් සේවකයෝ එකම සේවා ස්ථාන වල එකම අධීක්ෂණයක් යටතේ නිරත වෙති. ඔවුන් දෙපිරිසටම ලැබෙන්නේ එක හා සමාන පුහුණුවකි. සේවයට පැමිණීමේදි සහ පිටවීමේදි ඔවහු දෙපිරිසම එකම ඇඟිලි සටහන් යන්ත්‍රය භාවිතා කරති. මේ දෙපිරිස අතර ඇති එකම වෙනස වන්නේ එක් පිරිසකට අඩු අයිතිවාසිකම් හිමි වීමයි.

20. ශ්‍රී ලංකා ටෙලිකොම් ස්ථිර සේවකයෙකු රු. 180,000ක වාර්ෂික ප්‍රසාද දීමනාවකට හිමිකම් කියන අතර ඔවුන්ගේ අතිකාල පැයකට රු. 320ක් ගෙවනු ලැබේ. මෙයට සාපේක්ෂව මැන්පවර් සේවකයෙකුට ගෙවනු ලබන්නේ රු. 80,000 ක වාර්ෂික ප්‍රසාද දීමනාවක් සහ අතිකාල පැයකට රු. 170 ක දීමනාවකි. ටෙලිකොම් ස්ථිර සේවකයෙකුට මාසිකව රු. 14,000ක ආහාර සහ ප්‍රවාහන දීමනාවක්, රු. 1,000ක වෛද්‍ය පහසුකම් දීමානවක්, වසරකට වෛද්‍ය පරික්ෂණ සඳහා රු. 7,000ක දීමනාවක්, රු. 1,000,000 ක සහන නිවාස ණයක් සහ රු. 40,000 ක මෝටර් සයිකල් මිලදී ගැනීමේ ණය මුදලකට හිමිකම් කියයි. මැන්පවර් සේවකයෙකුට මේ කිසිදු වරප්‍රසාදයක් හිමි නොවේ.

මැනේජ්මන්ට් ලිමිටඩ් (Magampura Management Limited) නම් වරාය අධිකාරිය විසින්ම නිර්මාණය කරනු ලැබූ මැන්පවර් සමාගම වෙත බඳවාගනු ලැබීමයි.[21] වසර තුනක පරිවාස කාලයකින් පසු ඔවුන්ව වරාය අධිකාරියට අනුයුක්ත ස්ථිර සේවයේ පිහිටුවන බවට මෙම බඳවා ගැනීම්හි පත්වීම් ලිපිවල සඳහන්ව තිබිණ. නමුත් 2015 ආණ්ඩු පෙරළියෙන් පසුව[22] වරායේ හිමිකාරීත්වය සම්බන්ධයෙන් චීනය සමඟ 99 අවරුදු බදු ගිවිසුමකට එළැඹීමට රජය කටයුතු කිරීමට යන බව දැනගත් සේවකයෝ[23] නොසන්සුන් බවට පත්වූයේ සෘජුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත නොව හුදෙක් මාගම්පුර මැනේජ්මන්ට ලිමිටඩ් වෙත බඳවා ගෙන සිටින තමන්ගේ රැකියා සුරක්ෂිතතාවය එයින් අර්බුදයට යනු ඇතයි යන බිය හේතු කොටගෙනය.[24]

ශ්‍රී ලංකා ටෙලිකොම් සහ රුහුණු මාගම්පුර වරාය යන පිළිවෙලින් අර්ධ රාජ්‍ය සහ රාජ්‍ය ආයතන දෙකට වෙනස්ව ඉන්දියානු හිමිකාරීත්වයක් යටතේ පවත්නා ඇසෝසියේටඩ් බැටරි මැනුෆැක්චර්ස් (Associated Battery Manufactures) සමාගම වසර 6-7 ක පමණ කාලයක්

---

21. කොළඹ වරායේද මෙම ක්‍රමයම අනුගමනය කරනු ලැබ තිබින. ශ්‍රී ලංකා ටෙලිකොම්හි මෙන්ම කොළඹ වරායේද රජයේ සේවකයින් (වරාය අධිකාරිය වෙත බඳවා ගනු ලැබූ) සහ මැන්පවර් සමාගම් ඔස්සේ බඳවාගනු ලැබූ සේවකයින් ලෙස සේවක දෙකොට්ඨාශයක් වෙති. රුහුණු මාගම්පුර වරායේදී සිදුවූයේ එහි ආරම්භයේ සිටම මාගම්පුර මැනේජ්මන්ට් ලිමිටඩ් නම් වරාය අධිකාරිය විසින්ම නිර්මාණය කෙරුනු මිනිස් බල සැපයුම් ආයතනයක් වෙත සියලුම සේවකයින් බඳවා ගනු ලැබීමයි.

22. රුහුණු මාගම්පුර වරාය මහින්ද රාජපක්ෂගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වූ රජය විසින් චීනයේ Export-Import Bank වෙතින් ලබාගත් ඩොලර් මිලියන 307 ක ණය මුදලක් යොදා ගනිමින් ඉදිකරනු ලැබිනි. 2015 මැතිවරණයෙන් රාජපක්ෂ රජයට ආණ්ඩු බලය අහිමි විය.

23. රුහුණු මාගම්පුර වරාය චීනයට පැවරීමට යන බවට වූ කටකථා 2016 මැද භාගයේදී පළමු වරට මතු විය. 2017 දෙසැම්බර් 09 වන දින ශ්‍රී ලංකා රජය, චයිනා මර්චන්ට් පෝර්ට් හෝල්ඩිංග්ස් කම්පැනි සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය එක්ව නිර්මාණය කළ සමාගමක් වෙත 99 අවුරුදු බදු කාළයකට නිල වශයෙන් වරාය බදු දෙනු ලැබිණි. මෙම සමාගමේ කොටස්වලින් 85% ක් චයිනා මර්චන්ට් පෝර්ට් හෝල්ඩිංග්ස් කම්පැනි වෙත හිමි අතර 15% ක් ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු වේ.

24. සාගර, සම්මුඛ සාකච්ඡාව, ජූලි 22, 2018.

තිස්සේ තම ස්ථිර සේවකයින්ට අමතරව මැන්පවර් සමාගම් හරහා ද සේවකයින් බඳවා ගනු ලැබ තිබිණ. මෙහිදී අනාරක්ෂිත සහ වැඩි වෙහෙසක් දැරීමට සිදු වන කාර්යන් මෙන්ම දීර්ඝ සහ රාත්‍රී සේවා මුර ඉටු කිරීමේ වගකීම ද වැඩි වශයෙන් මැන්පවර් සේවකයින් වෙත පැවරී තිබුණේ ඔවුන්ට ස්ථිර සේවකයින්ට වඩා අඩු වැටුපක් ගෙවන අතරතුරේදීය.[25]

## අවිනිශ්චිත ශ්‍රමය (Precarious Labour) සහ කම්කරු අරගල

2000 කට අධික එස්එල්ටී හියුමන් කැපිටල් සොලියුෂන්ස් සේවකයෝ වරින් වර තමන්ව සෘජුවම ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත බඳවා ගන්නා ලෙස ඉල්ලීම් ඉදිරිපත් කර තිබුණු අතර අවසානයේ 2016 දෙසැම්බර් මාසයේදී ඔවුන් වැඩවර්ජනයක් ආරම්භ කළ අතර එය මාස තුනකට අධික කාලයක් අඛණ්ඩව පැවතුනි. මෙම වැඩවර්ජනයට 1200 කට වැඩි පිරිසක් සක්‍රීයව සම්බන්ධ වූහ.[26] රුහුණු මාගම්පුර මැනේජ්මන්ට් ලිමිටඩ් සේවකයෝ 2016 දෙසැම්බර් මාසයේදී තමන්ව සෘජුවම වරාය අධිකාරිය වෙත බඳවා ගන්නා ලෙස ඉල්ලා සිටිමින් සත්‍යග්‍රහයක් ආරම්භ කළ අතර පසුව එය වැඩවර්ජනයක් දක්වා පරිවර්තනය විය. එම කාලය තුළදී ඔවුන් විසින් වරයාට පැමිණ තිබූ නෞකාවන් දෙකක් පිටත් වීමට නොදී බලහත්කාරයෙන් රඳවා තබා ගැනුණු අතර, එම ක්‍රියාව මුහුදු මංකොල්ලයක් ලෙස අර්ථ නිරූපනය කරමින් එකී තත්ත්වය පාලනය කිරීමට නාවික හමුදාව යොදවන ලදී.[27] අනෙක් අරගල දෙකෙහිදී මෙන්ම ඇසෝසියේටඩ්

25. එම.

26. ගුරුසිංහ, සම්මුඛ සාකච්ඡාව, අගෝස්තු 15, 2018.

27.“Hambanthota Port employees continue strike action,” Newsfirst.lk, ප්‍රවේශය, ඔක්තෝබර් 06, 2018, https://www.newsfirst.lk/2016/12/09/hambantota-port-employees-continue-strike-action/

බැටරි මැනුෆැක්චරස් සේවකයෝ ද තම වෘත්තිය අරගලය ආරම්භ කරන්නේ ඔවුන්ව සෘජුවම කර්මාන්තශාලාවට බඳවා ගන්නා ලෙස ඉල්ලමිනි.[28]

මෙම වෘත්තීය ක්‍රියාමාර්ග පැවති මුළු කාලය පුරාම එම සේවකයින්ට මුහුණ දීමට සිදු වූ අභියෝගයන් තුළ නිරූපනය වූයේ මැන්පවර් ශ්‍රමය විසින් නිර්මාණය කරන ශ්‍රමයේ අවිනිශ්චිත ස්වභාවයයි. මැන්පවර්, නොඑසේනම් මිනිස්බල සැපයුම් සමාගම් හරහා ශ්‍රමය ලබාගැනීමේදී සේවකයින්ට ඇතිවන ගැටළුව වන්නේ ඔවුන්ට සිය අයිතිවාසිකම් සම්බන්ධයෙන් ගණුදෙනු කිරීමට සිදුවන්නේ තමන් ශ්‍රමය සපයන ආයතනයේ පාලනාධිකාරිය සමඟ නොව ඔවුන්ව සේවයට බඳවා ගනු ලැබූ මැන්පවර් ආයතන හිමියන් සමඟ වීමයි. අප මෙහිදී සාකච්ඡාවට ලක්කරන අරගල ත්‍රිත්වයට අදාලව පවසන්නේ නම් ශ්‍රී ලංකා ටෙලිකොම්, මාගම්පුර වරාය සහ ඇසෝසියේටඩ් බැටරි මැනුෆැක්චරස් ආයතනයන්හි සේවයකළ මැන්පවර් ශ්‍රමිකයින්ට ස්වකීය රැකියාව සම්බන්ධ ගැටළු සම්බන්ධයෙන් ගණුදෙනු කිරීමට සිදුවූයේ එකී ආයතන පාලනාධිකාරයන් සමඟ නොව තමන් බඳවාගෙන තිබූ මිනිස්බල සැපයුම් ආයතන (එස්එල්ටී සොලියුෂන්ස්, මාගම්පුර මැනේජ්මන්ට් ලිමිටඩ් සහ ඇසෝසියේටඩ් බැටරි මැනුෆැක්චරස් සමාගම සේවකයින් ලබාගත් පුද්ගලික මිනිස්බල සැපයුම් සමාගම්) කළමණාකාරීත්වයන් සමඟිනි. සේවකයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ ගැටළුවක් නිර්මාණය වන සෑම විටකම එකී වගකීම මිනිස්බල සැපයුම් ආයතනය වෙත පවරමින්, 'අපට ඔබ සම්බන්ධයෙන් බැඳීමක් නැත' යි පවසමින් සියළු වගකීම්වලින් නිදහස්වීමේ හැකියාව ඔවුන්ගේ සේවා ස්ථාන පාලනාධිකාරට හිමිවිය. මෙය ඔවුන් සේවයෙන් නෙරපා දැමීම දක්වා විහිදිය හැකිය. එස්.එල්.ටී. සොලියුෂන්ස් සහ මාගම්පුර මැනේජ්මන්ට් ලිමිටඩ් වැනි තම ආයතනයටම අනුබද්ධව නිර්මාණය

---

28. ලීනස් ජයතිලක, සම්මුඛ සාකච්ඡාව, ජූලි 15, 2018.

කළ මිනිස්බල සැපයුම් ආයතන හරහා ශ්‍රම සම්පාදනය කරගැනීමේදී අවශ්‍ය අවස්ථාවක තම ආයතනයේ පැවැත්මට කිසිදු අර්බුදයක් ඇති නොවන සේ එකී මිනිස්බල සැපයුම් ආයතනය ඇවර කරමින් සියලු සේවකයින්ගේ සේවය අවසන් කිරීමේ හැකියාව පවා මව් සමාගම් වෙත පවතී. මෙම රැකියා ස්වරූපය විසින් නිර්මාණය කරන අවිනිශ්චිත ශ්‍රමය (precarious labour) හේතුකොටගෙන බෙහෙවින් අසාධාරණ වැඩ තත්ත්වයන් යටතේ පවා එය ඉවසාගෙන සේවය කරන 'හීලෑ' කම්කරුවන් බිහිවනවා පමණක් නොව, සිය වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කිරීමේදී ද රැකියා සුරක්ෂිතතාවයක් නොවීමේ අවදානම බෙහෙවින් තීරණාත්මක වේ.

ටෙලිකොම් මැන්පවර් සේවකයින් සිය වෘත්තීය ක්‍රියාමාර්ගයන්ට එළැඹුනේ මේ සියළු අවදානම් දරාගනිමිනි. 2011 වසරේදී ද වැටුප් වැඩි කිරීමක් හා රැකියා ස්ථිර කිරීම් ඇතුළු ඉල්ලීම් කිහිපයක් මුල් කොටගෙන මැන්පවර් සහ ස්ථිර යන සේවක දෙකොටසම දින 10 ක වැඩ වර්ජනයක් සිදු කොට තිබූ අතර එහි බහුතර ඉල්ලීම් දිනාගත හැකි වූයේ ටෙලිකොම් ස්ථිර සේවකයින්ට පමණි. මැන්පවර් සේවකයින්ට හිමි වූයේ සුළු වැටුප් වැඩි වීමක් පමණි. 2015 අතුරු අයවැයේදී ද, 2016 වසරේ අග්‍රාමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවේ සිදු කළ කතාවක දී ද වසර 7 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කොට තිබූ මැන්පවර් සේවකයින් ස්ථිර කරන බවට සඳහන් කර තිබුණ ද එය කිසි විටක ඉටු වූයේ නැත.[29] මෙහිදී වඩාත් කැපී පෙනෙන සිද්ධිය නම් සේවකයින් ස්ථිර කිරීමේදී සලකා බලනු ලැබ තිබු නිර්ණායකය වන NVQ 4 වන මට්ටම[30] මැන්පවර් සේවකයින්ගෙන් බහුතරයක් ද

29. ගුරුසිංහ, සම්මුඛ සාකච්ඡාව, අගෝස්තු 15, 2018.

30. NVQ (ජාතික වෘත්තීය සුදුසුකම්) යනු 1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත මගින් හඳුන්වා දෙනු ලැබූ ජාතික මට්ටමින් පිළිගත් වෘත්තීය අධ්‍යාපන රාමුවකි. NVQ 4 යනු ජාතික මට්ටමේ පරිපූර්ණ ශිල්පීයත්ව මට්ටම යි (http://www.tvec.gov.lk/?page_id=140).

තෘප්ත කර තිබීමයි. මැන්පවර් සේවකයින් විසින් ආරම්භ කරන ලද වැඩවර්ජනයට ස්ථිර සේවකයින් සම්බන්ධ නොවූ අතර එයට හේතු වූයේ මැන්පවර් සේවකයින්ද ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කළහොත් ස්ථිර සේවකයින් වෙත දැනට හිමිව ඇති වරප්‍රසාද කප්පාදු වේ යැයි පැවති බියයි.[31] මෙම බිය දිගින් දිගටම ආයතන කළමණාකාරීත්වය විසින් ද ඔවුන් තුළ ඇතිකරවන ලද්දකි.[32]

රුහුණු මාගම්පුර වරාය අරගලයේදී මාගම්පුර මැනේජ්මන්ට් ලිමිටඩ් වෙත සේවකයින් බඳවා ගැනීමේදි යොදා තිබු කොන්දේසියක් වූ අවුරුදු තුනක පරිවාස කාලය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඔවුන්ව ස්ථිර සේවයට අනුයුක්ත කිරීමේ පොරොන්දුව හේතු කොටගෙන එකී කාලය සම්පූර්ණ වන තෙක් සත්‍යග්‍රහය සඳහා ඔවුන් සම්බන්ධ වූයේ නැත. ඔවුන් වෙනුවට සත්‍යග්‍රහයට සෘජුව සම්බන්ධ වූයේ ඔවුන්ගේ දෙමාපියන්ය[33] (වසර තුනක කාලය සම්පූර්ණ වීම අරගලය පැවති කාල සීමාව තුළදීම සිදු වූ බැවින් ඉන් අනතුරුව ඔවුහුද වෘත්තීය ක්‍රියාමාර්ගයට එකතු වූහ). අනෙක් අතට වෘත්තීය ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් පාලනාධිකාරය විසින් වැඩවර්ජනයේ සිව් වන දිනයේදී ලබා දුන් ප්‍රතිචාරය වූයේ පසුදින උදෑසන 10 වන විට සේවයට වාර්ථා නොකරන්නේ නම් ඔවුන් සේවය හැරගියා සේ සලකන බවයි. ඇසෝසියේටඩ් බැටරි මැනුෆැක්චරර්ස් හි වෘත්තීය ක්‍රියාමාර්ගයේදී ද ආයතනයේ පාලනාධිකාරය විසින් ගත් ප්‍රථම ක්‍රියාමාර්ගය වූයේ වෘත්තීය සමිතියේ කැඳවුම්කරු සහ භාණ්ඩාගාරික යන දෙදෙනා ම සේවයෙන් නෙරපා හැරීමයි.[34]

31. ගුරුසිංහ, සම්මුඛ සාකච්ඡාව, අගෝස්තු 15, 2018.

32. එස්. රාජපක්ෂ, සම්මුඛ සාකච්ඡාව, මැයි 22, 2018.

33. සාගර, සම්මුඛ සාකච්ඡාව, ජූලි 22, 2018.

34. අමරසිංහ, සම්මුඛ සාකච්ඡාව, ජූලි 12, 2018.

## අරගලය වෙනුවට පක්ෂ දේශපාලනය

මැන්පවර් ශ්‍රමයේ පවතින මෙකී අවිනිශ්චිත ස්වභාවය දේශපාලන අධිකාරිය විසින් ද (අර්ධ රාජ්‍ය සහ රාජ්‍ය ආයතන වන ටෙලිකොම් සහ රුහුණු මාගම්පුර වරාය සම්බන්ධයෙන්) තමන්ගේ දේශපාලන වාසි තකා කළමණාකරණය කරනු ලැබීම කැපී පෙනෙන සුළු කරුණක් විය. මාගම්පුර මැනේජ්මන්ට් සමාගම එවකට පැවති ආණ්ඩුවේ ආධාරකරුවන්ගේ සහයෝගය දිගටම පවත්වා ගැනීම සඳහා එකී රැකියා අවස්ථාවන් ඔවුන් වෙත ලබා දී තිබුණේ දේශපාලන උපක්‍රමයක් වශයෙනි. තමන් ලද රැකියාව අවිනිශ්චිත මැන්පවර් සමාගමකට අනුයුක්ත වූවක් වන බැවින් රැකියා ස්ථායීතාවය සඳහා එම ආණ්ඩුව අඛණ්ඩව බලයේ සිටීම වැදගත් බව සේවකයින් විසින් වටහාගෙන තිබූ අතර එකී රැකියා අවිනිශ්චිතතාවය විසින් ඔවුන්ගේ සහයෝගය ආණ්ඩුවට තහවුරු කරන ලදී.[35] ටෙලිකොම් මැන්පවර් අරගලයේදී ද ටෙලිකොම් සොලියුෂන්ස් සඳහා බඳවා ගත් බොහෝ දෙනෙකු එක්තරා දේශපාලන පක්ෂයක් සමඟ සම්බන්ධකම් ඇත්තවුන් බවට පොදු මතයක් පවතින අතර මැන්පවර් සේවකයින් සහ දේශපාලකයින් අතර සමීප සම්බන්ධයක් පවත්නා බව බොහෝ දෙනා පිළිගත් කරුණකි.[36] මෙහි ප්‍රතිඵලය වූයේ සේවකයින් තමන් විසින් ගොඩනගාගත් වෘත්තීය සමිති ඔස්සේ තම අයිතිවාසිකම් වෙනුවෙන් වන සටන් රටේ වෘත්තීය සමිති ව්‍යාපාරය සමඟ බද්ධ කරනු වෙනුවට දේශපාලකයින් ඔස්සේ එකී ඉල්ලීම් දිනාගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමයි (අනෙක් අතට දේශපාලඥයින් විසින් නිර්මාණය කරනු ලැබූ ගැටළුවක් විසඳා දෙන ලෙස එය නිර්මාණය කළ දේශපාලනඥයින්ගෙන් සේවකයින් ඉල්ලා සිටීම ද පුදුමයක් නොවේ).

35. සාගර, සම්මුඛ සාකච්ඡාව, ජූලි 22, 2018.

36. ගුරුසිංහ, සම්මුඛ සාකච්ඡාව, අගෝස්තු 15, 2018.

මාගම්පුර වරායේ වැඩවර්ජනය කම්කරු අමාත්‍යවරයා විසින් අනිවාර්ය බේරුම්කරණයට[37] යොමු කිරීමෙන් ඇනහිටින ලද නමුත් බේරුම්කරණ ක්‍රියාවලිය අතරමගදී සිදුවූ දේශපාලන මැදිහත්වීම් හේතු කොටගෙන සේවක ගැටළුව නිමාවට පත්විය. මෙම වෘත්තීය ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් ද කමිටුවක් පත්කර ඒ වන විට නිර්දේශ ලබාගෙන තිබූ අතර විවිධ අමාත්‍යවරුන් සහ ඔවුන්ට සම්බන්ධකම් ඇති දේශපාලන ක්ෂේත්‍රයේ සක්‍රීය භික්ෂූන්ගේ මැදිහත්වීමෙන් එකී කමිටු නිර්දේශ වලටත් වඩා අඩු විසඳුමකින් සේවකයින් සෑහීමකට පත් කරවා ගැනීමට ඔවුන් සමත්ව තිබිණි. අවසානයේ NVQ 4 වන මට්ටම තෘප්ත කළ පිරිස ස්ථිර සේවයට බඳවා ගැනීමටත් සෙසු අය ලක්ෂ 10 බැගින් වන්දි ලබා ගැනීමෙන් සෑහිමට පත්වීමටත් සේවකයෝ එකඟ වූහ. මේ කාළ වකවානුව තුළම රට තුළ පළාත් පාලන මැතිවරණය ද පැවත්විණ.[38] වෘත්තීය සමිතියේ ලේකම්වරයා ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණෙන් මැතිවරණයට තරඟ කළ අතර ඔහු අරගලයෙන් සම්පූර්ණයෙන් බැහැර විය. අරගලයට නායකත්වය සැපයූ තවත් කීපදෙනෙක් පොදුජන එක්සත් පෙරමුණේ අමාත්‍යවරයෙකුගේ ප්‍රබල ආධාරකරුවන් වශයෙන් මේ වන විට ද කටයුතු කරමින් සිටිති. රැකියා ලබා දීමේදී NVQ 4 වන මට්ටම සුදුසුකම ලෙස පිළිගන්නා බවට එකඟව තිබුණ ද, රැකියා අවස්ථා තීරණය කිරීමේදී එකී නිර්ණායකය සෑම විටකම එක හා සමානව ක්‍රියාත්මක කරනු නොලැබිණ. ස්ථිර රැකියා හිමිවූ සියලු දෙනාම පාහේ කළුතර හා හම්බන්තොට දිස්ත්‍රික්කවල අයවළුන් වූහ. එනම්, කළුතර දිස්ත්‍රික්කයට රැකියා අවස්ථා 40 ක් සහ හම්බන්තොට දිස්ත්‍රික්කයට රැකියා 96 ක්

37. 1950 අංක 53 දරන කාර්මික ආරවුල් පනතේ 4 වන වගන්තියට අනුව කම්කරු අමාත්‍යවරයාට, කාර්මික ආරවුලක් අනිවාර්ය බේරුම්කරණයට හෝ කාර්මික අධිකරණය වෙත යොමු කිරීමේ හැකියාව පවතී.

38. 2017 නොවැම්බර් 15 වන දින සිට දෙසැම්බර් 18 වන දින දක්වා පලාත් පාලන මැතිවරණය සඳහා නාම යෝජනා භාර ගැනුනු අතර 2018 පෙබරවාරි 8 වන දින මැතිවරණය පැවැත්වුනි.

හිමි විය. මෙම රැකියා අවස්ථා තහවුරු කරගැනීමට නම් සේවකයින්ට කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කළ හිටපු කම්කරු ඇමතිවරයකුට හෝ හම්බන්තොට දිස්ත්‍රික්කය නියෝජනය කළ එක්සත් ජනතා නිදහස් සංධානයේ ප්‍රබල දේශපාලඥයකුට සහයෝගය දැක්වීමට සිදුවිය.[39] ටෙලිකොම් මැන්පවර් අරගලයේ දීද මුල් අවස්ථාවේදී සේවකයින් හා දේශපාලනඥයින් අතර තිබූ සම්බන්ධතා පදනම් කරගනිමින් විවිධ දේශපාලනඥයින් ඒ වෙත විවිධ මැදිහත්වීම් සිදු කොට තිබිණ. වරෙක එක් දේශපාලනඥයෙකු ප්‍රකාශ කර තිබුණේ තමන් පවත්නා රජයේ තුන්වන බලවත්ම පුද්ගලයා බවත් තමාට මෙය විසඳා දිය හැකි බවත්ය.[40] නමුත් වඩාත් නාගරික දේශපාලන අවකාශයක ක්‍රියාත්මක වූ මෙම අරගලය බහුවිධ මැදිහත්වීම්වල[41] ප්‍රතිඵලක් ලෙස වඩාත් ස්වාධීන සහ අරගලකාරී ස්වරූපයක් අත්කර ගැනීමට සමත් විය. දින 87 ක කාලයක් පුරා පැවති වැඩවර්ජනය මාරාන්තික උපවාසයක් දක්වා දීර්ඝ වූ අතර කම්කරු අමාත්‍යවරයා විසින් මෙම අරගලයද අනිවාර්ය බේරුම්කරණයට යොමු කිරීමත් සමඟ අවසන් කිරීමට සිදු විය. මේ සමඟම අරගලයේ තීව්‍රතාවය බිඳ වැටුණු අතර පසු අවස්ථාවක 400 ක පමණ සේවක පිරිසක් ස්ථිර සේවයට බඳවා ගැණිනි. ටෙලිකොම් පාලනාධිකාරය විසින් දේශපාලනඥයින්ගේ සහභාගීත්වය සහිත උත්සවයකදී එකී පත්වීම් ලිපි ලබා දෙනු ලැබූ අතර ඒවා ඔවුන් විසින් සේවකයින්ට ලබා දුන් පරිත්‍යාගයක් ලෙස හුවා දක්වනු ලැබිණි.[42] ඇසෝසියේටඩ් බැටරි මැනුෆැක්චර්ස් වැඩ වර්ජනය දින 9 ක් පුරා පැවති අතර එය අවසන් වූයේ සියලු මැන්පවර් සේවකයින්ගේ සේවය අත්හිටුවීමෙනි. නමුත් මෙහිදී ටෙලිකොම් අරගලයේදී මෙන් නොව

39. සාගර, සම්මුඛ සාකච්ඡාව, ජූලි 22, 2018.

40. ගුරුසිංහ, සම්මුඛ සාකච්ඡාව, අගෝස්තු 15, 2018.

41. ප්‍රකට වෘත්තීය සමිති නායකයින්, විවිධ සිවිල් සමාජ සංවිධාන, සිවිල් බුද්ධිමතුන් වැනි විවිධ පිරිස් මීට සිය සහෝදරාත්මක මැදිහත්වීම පළකර සිටින ලදී.

42. එල්. හේමචන්ද්‍ර, සම්මුඛ සාකච්ඡාව, ජූලි 3, 2018.

ස්ථිර සේවකයින් ද මැන්පවර් සේවකයින් සමඟ වැඩවර්ජනයට එකතු වීම නිසාවෙන් වැඩවර්ජනය නිමවීමෙන් අනතුරුව කිහිප දෙනාගෙන් යුත් කණ්ඩායම් බැගින් අවස්ථා ගණනාවකදී මැන්පවර් සේවකයින් මේ වන විට ස්ථිර සේවයට බඳවා ගනු ලැබ ඇත. එනමුත් වැඩවර්ජනයේ යෙදුණු කාලය වැටුප් රහිත නිවාඩු ලබාගත් කාලයක් ලෙස සලකා වාර්ෂික පඩි වැඩිවීම අත්හිටවුනු ලැබ තිබේ.[43] මෙහි අප සාකච්ඡා කළ කම්කරු අරගල ත්‍රිත්වය තුළම නිරූපණය වන පොදු ලක්ෂණය වන්නේ මැන්පවර් ශ්‍රම සැපයුම විසින් සේවකයින් ඇද දමා ඇති අවිනිශ්චිත තත්ත්වයේ ස්වරූපයයි. එතුළින් සේවකයින් තම අයිතිවාසිකම් වෙනුවෙන් ස්වාධීනව සටන් කරනු වෙනුවට, ඔවුන්ව දේශපාලනයේ ගොදුරු බවට පත් කරමින් වඩා අදේශපාලනික ලෙස, දේශපාලනඥයින් පසු පස යන, 'හීලෑ' වූ කම්කරුවෙකු බිහි කර ඇත. මෙම අරගල ත්‍රිත්වය තුළ ක්‍රියාකාරීව කටයුතු කළ ක්‍රියාධරයින් තිදෙනෙකු තම අත්දැකීම් සංක්ෂිප්ත කළේ මෙසේය.

> "අපි කළේ වෘත්තීය අරගලයක් අන්තිමට ඒක ඉවර වුනේ දේශපාලනඥයින් පසුපස ගිහිල්ලා"
>
> **- මාගම්පුර වරායේ වෘත්තීය සමිති නායකයෙක්**

> "අපි සහය දුන්නේ අරගලයකට, දැන් සමහරුන්ට අනුව මේක දිනාගත් දෙයක් නෙවෙයි දේශපාලනයෙන් ලැබුණ දෙයක්"
>
> **- ටෙලිකොම් මැන්පවර් සටනට සක්‍රියව සහය වූ ක්‍රියාකාරිණියක්**

> "මැන්පවර් සමහරුන්ට සේවය අහිමි වුනත් යම් පිරිසක් ස්ථිර වුනා. දැන් වැඩ කරන කම්කරුවන්ගේ රැකියා පීඩනය අඩුවීම ජයග්‍රහණයක් කියල සේවකයින් විශ්වාශ කරනවා"
>
> **- ඇසෝසියේටඩ් බැටරි මැනුෆැක්චර්ස් හි මව් වෘත්තීය සමිතියේ නායකයෙක්**

43. අමරසිංහ, සම්මුඛ සාකච්ඡාව, ජූලි 12, 2018.

මෙම මැන්පවර් අරගල ත්‍රිත්වයේ සිදුවීම් හා එහි අවසන් ප්‍රතිඵලයන් සම්බන්ධයෙන් වඩා පුළුල් ඇගයීමක් සිදුකිරීමට නම් මැන්පවර් ශ්‍රම සැකසුම් ස්වභාවයට පදනම දැමූ ආර්ථිකමය එළැඹුම සම්බන්ධයෙන් වන පුළුල් සාකච්ඡාවක් අවශ්‍ය වේ.

## නවලිබරල්වාදය සහ පැරණි ඒකාධිපතිවාදය

නවලිබරල්වාදය විසින් නව ප්‍රාග්ධන-ශ්‍රම සබඳතාවයක් (ශ්‍රමය තුන්වන පාර්ශ්වයක් වෙතින් කුලියට ගැනීම) නිර්මාණය කරමින් සහ නම්‍යශීලී ශ්‍රමය ප්‍රවර්ධනය කරමින් කම්කරුවා වඩාත් පහසු ගොදුරක් බවට පත්කොට ඇති බව පැහැදිලිය. වෘත්තීය සමිති ව්‍යාපාරය බිඳ වට්ටවා දුර්වල කොට ඇති සන්දර්භයක් තුළ මෙම කම්කරුවන්ව පහසුවෙන්ම ආණ්ඩු බලය හොබවන දේශපාලන පක්ෂවල අතකොළු බවට පත්කර ගැනීමේ හැකියාව ද ලැබී තිබේ. මේ අනුව මෙම රට තුළ කම්කරුවන් විසින් දිනාගෙන තිබූ අයිතිවාසිකම් හා ප්‍රජාතාන්ත්‍රික අයිතීන් නවලිබරල් ආර්ථිකය විසින් ඇතුලතින් බිඳදමා ඇත. ඇල්ස්ටන් දක්වා සිටින ආකාරයට නවලිබරල්වාදය යනුම ප්‍රජාත්නත්‍ර විරෝධී සංසිද්ධියකි.

> "නව ලිබරල් දැක්මට අනුව බහුජන ප්‍රජාතන්ත්‍රවාදය කල්ලිවාදී පාලනයට සමාන වේ. මෙය විසින් ප්‍රාග්ධන සංකේන්ද්‍රණය කෙරෙහි සියළු ආකාරයේ බාධාවන් නිර්මාණය කරන අතර 1970 ගණන්වල පැවැති ඉහල පංතියේ බලයට මෙය අභියෝග කරයි. මේ තත්ත්වය තුළ ප්‍රාග්ධන සංකේන්ද්‍රණය වැඩිදියුණු කිරීමේ ඉලක්කය වටා රාජ්‍යයේ ප්‍රධාන ව්‍යාපාරික අභිරුචීන් සම්බන්ධීකරණය කිරීම සිදුකරන රාජ්‍ය හා පුද්ගලික හවුල්කාරීත්වය වෙත වැඩි ප්‍රමුඛතාවක් හිමිවන ආණ්ඩුකරණ ස්වරූපයට වැඩි මනාපයක් හිමිවේ. එහි ප්‍රතිඵලය වන්නේ

නියාමනයට ලක්වන්නා විසින්ම නියාමනයේ නීති සකස් කරනු ලැබීම සහ රාජ්‍ය සහ පුද්ගලික විභේදනය කිසිදා නොවූ විරූ අන්දමින් අපැහැදිලිව යාමයි."[44]

මේ අනුව නවලිබරල් පර්යාය තුළ මහබැංකුව සහ ණය බලය පාලනය කෙරෙන බලවත් අර්ධ රාජ්‍ය ව්‍යුහයන් නිර්මාණය කෙරෙන අතර මෙම ව්‍යුහයන්හි පාලනය පවත්වා ගැනීම අන්තර්ජාතික මට්ටමින් ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ අන්තර්ජාතික වෙළඳ සංවිධාන විසින් සිදු කරනු ලබයි. මෙම සියළු ව්‍යුහයන් ක්‍රියාත්මක වන්නේ ප්‍රජාතාන්ත්‍රික පාලනයන් සහ ජනතාවගේ අධීක්ෂණ ක්ෂේත්‍රයට ඔබ්බෙනි.[45] වර්තමාන කතිකාව තුළ අධිකාරීත්වය හිමිකොටගෙන සිටින මානව හිමිකම් විරෝධී ජනප්‍රියවාදී අදහස් අප විසින් වටහාගත යුතු වන්නේ මේ සන්දර්භය තුළය. එනම් ආර්ථික කළමණාකරණය තුළ කිසිදු ප්‍රජාතන්ත්‍රවාදයක්, වගවීමක් හෝ විනිවිදභාවයක් නොමැති ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා වන දෘෂ්ටිවාදී පෙරමුණක් ලෙස ජාතික ආරක්ෂාව, ස්වාධිපත්‍යය, ආර්ථික ජාතිකවාදය මුල් කොටගත් නව මානව හිමිකම් විරෝධී තර්කනයක් වෙත ලෝක පරිමාණයෙන් අප අභිමුඛ කරවනු ලැබ ඇත.

ඉහත අප සාකච්ඡා කළ කම්කරු අරගලවලට එරෙහිව නගනු ලැබූ තර්කයන් සහ ගනු ලැබූ පියවර සමීපව විමසා බැලූ කළ ජාතික ආරක්ෂාව, ස්වාධිපත්‍යය, ආර්ථික ජාතිකවාදය යන අදහස් එකී කම්කරු අරගල මැඩ පැවැත්වීමට යොදාගනු ලැබූ ආකාරය පෙනීයයි. ටෙලිකොම් වෘත්තීය සමිති මෙන්ම ටෙලිකොම් මැන්පවර් සේවකයින් ද ආරම්භ කළ වෘත්තීය ක්‍රියාමාර්ග වලට එරෙහිව අතුරු

44. David Harvey, *Neoliberalism and Restoration of Class Power*, ප්‍රවේශය සැප්තැම්බර් 22, 2018, https://gsnas.files.wordpress.com/2007/10/harvey080604.pdf.

45.Phillip Alston. "The Populist Challenge to Human Rights." Journal of Human Rights Practice, Volume 9, Issue 1, (2017): 1–15.

තහනම් නියෝගය ලබා ගනු ලැබුයේ එය මහජනයාට පීඩාකාරී වන බවත්, ඒ හරහා එය රටේ ආර්ථික කටයුතුවලට බාධා ගෙන දෙන බවත් දක්වමිනි.[46] තවත් එවැනිම නියෝගයක් ලබා ගැනීමේදී ඉදිරිපත් කෙරුණු තර්කය වූයේ එම වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයේ අරමුණ ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ කටයුතු බිඳ දැමීමේ කඩාකප්පල්කාරී චේතනාවෙන් වන බවයි.[47] තවත් අවස්ථාවකදී ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය ශ්‍රී ලංකා පොලීසියට එරෙහිව අභියාචනාධිකරණයේ රිට් ආඥා ඉල්ලීමක් ඉදිරිපත් කළේ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 106(3) වගන්තිය යටතේ තහනම් නියෝයක් ලබා ගත්ත ද ඒ යටතේ විරෝධතාකරුවන් මැඩ පැවැත්වීමට පොලීසිය ප්‍රමාණවත් පියවර නොගත් බව පවසමිනි.[48] ටෙලිකොම් අරගලයේ විවිධ අවස්ථා වල නඩු කටයුතු (වාරණ නියෝග) වලදී මෙන්ම ප්‍රසිද්ධ ජනමාධ්‍ය වෙත කළ අදහස් දැක්වීම් වලදී ද ඉද්රිපත් වූ ප්‍රධානතම අදහසක් වූයේ වැඩ වර්ජන වලදී සේවකයින් විසින් ආයතනික දේපලට අලාභ හානි සිදු කරමින් කඩාකප්පල්කාරි ක්‍රියා වල නිරතවන බවය.[49] එහිදි සේවකයින් හැදින්වීම සඳහා යොදා ගැණුනු වචනය වන්නේ මැර කල්ලි (mob gang) යන යෙදුමයි. මාගම්පුර වරායේ මැන්පවර් වැඩ වර්ජනයේදී ද සේවකයින් විදේශිය නැව් දෙකක් වරායෙන් පිට වීමට ඉඩ නොදී රඳවා තබා ගත් අවස්ථාවේදී නාවික හමුදාව ඊට මැදිහත් වෙමින් එකී මැදිහත්වීම සාධාරණීකරණය කළේ මෙය මුහුදු නැව් කොල්ලකෑමක් හා සමාන ලෙස සැලකිය හැකි බවත් එබැවින් එවැන්නක් මැඩපැවැත්වීට

46. කොළඹ මහේස්ත්‍රාත් අධිකරණ නඩු අංක ඊ 4132/16.

47. කොළඹ දිසා අධිකරණ නඩු අංක 3/2017/DSP.

48. "Sri Lanka Telecom files a writ petition against Police inaction over manpower employees", ප්‍රවේශය ඔක්තෝබර් 20, 2018, http://www.dailynews.lk/2017/03/24/law-order/111439/sri-lanka-telecom-files-writ-petition-against-police-inaction-over.

49. "Enjoying order against SLT trade union protests", ප්‍රවේශය ඔක්තෝබර් 18, 2018, http://www.sundayobserver.lk/2017/01/15/business/enjoining-order-against-slt-trade-union-protests?page=1

නාවික හමුදාවට මැදිහත් විය හැකි බවත් පවසමිනි.[50] අග්‍රාමාත්‍යවරයා පාර්ලිමේන්තුවේදී මේ සම්බන්ධව ප්‍රකාශයක් කරමින් කියා සිටියේ මෙම සිද්ධිය හේතුවෙන් සිදුවන ආර්ථික පාඩුව ජාතික ආර්ථිකයට ඉමහත් බරක් වනු ඇති බවයි.[51] නාවික හමුදාවේ මෙම මැදිහත් වීම නියෝජ්‍ය ආරක්ෂක ඇමතිවරයා සාධාරණීකරණය කරනු ලැබුවේ වරාය කම්කරුවන් තවදුරටත් මුහුදු මංකොල්ලකරුවන් ලෙස මිස වරාය සේවකයින් ලෙස සැළකිය නොහැකි බව පවසමිනි.[52] මේ සියලු තර්කයන් සහ ක්‍රියාකාරීත්වයන් විසින් යළි යළිත් අවධාරණය කිරීමට උත්සාහ ගනු ලබන තර්කය වන්නේ අයිතිවාසිකම් පිළිබඳ අරගලයන් ජාතික ආරක්ෂාවටත්, ජාතික ආර්ථිකයටත් අහිතකර ලෙස බලපාන බවයි. එනම් මේ ද්විත්වය විසින් අපේක්ෂා කරන 'සංවර්ධනය' කෙරෙහි මානව හිමිකම් අනර්ථකාරී ලෙස බලපාන බවයි. මේ වන විට සමාජයේ ඉමහත් ආන්දෝලනයකට මුල් වී ඇති ප්‍රති-ත්‍රස්තවාදි පනත් කෙටුම්පත (Counter Terrism Bill) තුළින් ද මානව හිමිකම් අභියෝගයට ලක් කරන්නේ මෙම පදනමිනි.

මෙම පනත් කෙටුම්පතේ 'ත්‍රස්තවාදී වරද' යන්න නිර්වචනය කොට ඇත්තේ 'යම් ක්‍රියාවක් සිදු කිරීම හෝ සිදුකිරීම වැළැක්වීමට ශ්‍රී ලංකාවේ ආණ්ඩුව හෝ වෙනත් යම් ආණ්ඩුවක් හෝ ජාත්‍යයන්තර සංවිධානයක් සාවද්‍ය ලෙස හෝ නීති විරෝධි ලෙස පෙළඹවීමේ අරමුණින් යුතුව,

---

50. "Sri Lanka Navy breaks up protests at Hambanthota Port," https://worldmeritimenews.com, ප්‍රවේශය නොවැම්බර් 16, 2018, https://worldmaritimenews.com/archives/208445/sri-lanka-navy-breaks-up-protests-at-hambantota-port/

51. "What happened in Hambanthota," Roar.media, ප්‍රවේශය ඔක්තෝබර් 7, 2018, https://roar.media/english/life/reports/what-happened-in-magampura/

52. "Attack on Hambanthota port workers: state minister rejects allegations," Sundayobserver.lk, ප්‍රවේශය ඔක්තෝබර් 6, 2018, hhttp://www.sundayobserver.lk/2016/12/11/news/attack-hambantota-port-workers-state-minister-rejects-allegations

- යම් රාජ්‍ය හෝ පෞද්ගලික දේපල ඇතුළුව දේපල වලට, මහජන භාවිත ස්ථානයකට රාජ්‍යයේ හෝ ආණ්ඩුවේ පහසුකමකට, රාජ්‍ය හෝ පෞද්ගලික ප්‍රවාහන පද්ධතියකට හෝ යම් යටිතල පහසුකමකට හෝ පරිසරයකට බරපතල හානි සිදු කිරීම.
- අත්‍යවශ්‍ය සේවා වලට හෝ සැපයීම් වලට බරපතළ බාධා හෝ හානි සිදු කිරීම.
- යම් අත්‍යවශ්‍ය සේවා හෝ සැපයීම් සමග සම්බන්ධ යම් තීරණාත්මක යටිතල පහසුකමකට හෝ ප්‍රවර්ධන පහසුකමකට බාධා ඇතිකිරීම හෝ අලාභ හානි සිදු කිරීම හෝ ඒ සඳහා මැදිහත් වීම.
- සංඥා සම්ප්‍රේෂණයක් සහ වෙනත් යම් සංඛ්‍යාත පදනම් වූ සම්ප්‍රේෂණ පද්ධතියක් ඇතුළුව යම් ඉලෙක්ට්‍රොනික්, ඇනලොග්, ඩිජිටල් හෝ වෙනත් රැහැන් සහිත හෝ රහිත සම්ප්‍රේෂණ පද්ධතියකට අවහිර කිරීම හෝ අලාභහානි සිදු කිරීම'.

යනාදියද ඇතුලත් කොටගනිමිනි.[53] මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් වන්නේ යුද්ධය නිමවී සාමය උදාවී දශකයක් තරම් කාලයක් ගතව සංවර්ධනය රටේ ප්‍රධාන කතිකාව බවට පත්ව තිබෙන සන්දර්භයකය යන්න මෙහිදී අපගේ අවධානයට ලක්විය යුතුය.

## වඩා වැදගත් කුමක් ද? ජාතික ආරක්ෂාවද, මානව සුරක්ෂිතතාවය ද?

ඒකාධිපතිවාදය වේගවත් ලෙස මේ යුගයේ අධිපති දෘෂ්ටිවාදය ලෙස ඉදිරියට පැමිණෙද්දී මානව හිමිකම් සුරක්ෂිත කිරීම සම්බන්ධයෙන් අපට ඇති අපේක්ෂාවන් මොනවාද? මේ මානව හිමිකම්වල අවසානයද?

53. ප්‍රති-ත්‍රස්ත පනත් කෙටුම්පත, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය, II කොටස 2018 සැප්තැම්බර් 18, 15.3 (2) (ඈ), (උ), (ඌ), ප්‍රවේශය ඔක්තෝබර් 18, 2018. http://www.documents.gov.lk/files/bill/2018/9/528-2018_E.pdf

> "අභියෝගයන්ගේ පරිමාණය කෙතරම් තීව්‍ර වුවද අප විසින් අපගේ එලැඹුම අත්හළ යුතු නැත. මානව හිමිකම් ආරක්ෂා කරගැනීම කවර කලෙක හෝ සම්මුතිගත ව්‍යාපෘතියක් නොවීය. එය හැමවිටම අරගලකාරී ව්‍යාපෘතියක් විය. වර්තමාන මානව හිමිකම් තන්ත්‍රය පරව නැගුනේ අත්‍යන්ත ඒකාධිපතිවාදී දුෂ්කෘතීන් හා ලෝකය එදා මෙදා තුර දුටු බලවත්ම විනාශයන්ගේ අළු මතිනි."[54]

මානව හිමිකම් විරෝධී ජනප්‍රියවාදී පසුබිම තුළ අප විසින් වටහාගත යුතුව ඇත්තේ මානව හිමිකම් සුරක්ෂිත කරගැනීම අනවරත අරගලයක් බවයි. මේ අනුව ඉහත කී වර්තමාන අභියෝගයන්ට මුහුණදීම සඳහා මානව හිමිකම් කතිකාව කෙතරම් ශක්ති සම්පන්න වන්නේ ද යන්න විමසා බැලීම වටී. ඉහතින් ද සඳහන් කළ පරිදි වර්තමාන ජනප්‍රිය කතිකාවේ ප්‍රධාන තර්කය වන්නේ ජාතික ආරක්ෂාව, ස්වාධිපත්‍ය සහ ආර්ථික ආර්ථිකය වෙනුවෙන් මානව හිමිකම් සීමා කළහැකි බවයි. මෙම තර්කයට එරෙහිව මානව හිමිකම් කතිකාව වෙතින් ඉදිරිපත්ව ඇති ප්‍රති-තර්කයන් මොනවාදැයි මඳක් විමසා බලමු.

> "ජාතික ආරක්ෂාව නැමැති පටු සංකල්පයේ සිට බොහෝ පැතිකඩ අන්තර්ගත කොටගත් මානව ආරක්ෂාව වෙත පරිවර්තනය වීමට කාලය පැමිණ තිබේ. ධනවත් ජාතීන්ගේ ජනතාව ස්වකීය මහපාරවල්වල සිදුවන අපරාධ සහ මත්ද්‍රව්‍ය සටන්වලින් ආරක්ෂාවීම පිළිබඳව කල්පනා කරන අතර දුගී රටවල ජනතාව අනවරත කුසගින්න, රෝග පීඩා සහ දරිද්‍රතාවයෙන් නිදහස ඉල්ලා සිටිති."[55]

54. Phillip Alston. "The Populist Challenge to Human Rights." *in Journal of Human Rights Practice*, Volume 9, Issue 1, (2017): 1–15.

55. Human Development Report 1994, United Nations Development Programme (UNDP) Oxford: Oxford University Press, 1994, 22

1994 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ වාර්තාව මානව සුරක්ෂිතතාවය ප්‍රධාන කාණ්ඩ 7 ක්, එනම් ආර්ථික, ආහාර, සෞඛ්‍ය, පාරිසරික, පුද්ගලික, ප්‍රජා සහ දේශපාලන සුරක්ෂිතතාවය ලෙස වර්ගීකරණය කරනු ලබයි. මානව සුරක්ෂිතතාව තුළ මිනිසාගේ කේන්ද්‍රීය බව තහවුරු කරන පොදු එකඟතාවයක් 2012 සැප්තැම්බර් 10 වන දින සම්මත කර ගැනුනු එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල යෝජනා අංක 66/290 විසින් ඉදිරිපත් කරන ලදී. සංවර්ධනය සඳහා ඇති අයිතිවාසිකම පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනය (1986)[56], පරිසරය සහ සංවර්ධනය පිළිබඳ රියෝ ප්‍රකාශනය (1992)[57] වැනි විවිධාකාර එක්සත් ජාතීන්ගේ එකඟතාවයන් තුළ පමණක් නොව තිරසාර සංවර්ධන ඉලක්ක[58] තුළ ද මිනිසාගේ කේන්ද්‍රීය බව නැවත නැවතත් ප්‍රකාශයට පත්කරනු ලැබ ඇත. ඵලදායී සහ වැටුප් ලබන රැකියාවකින් ලැබෙන මූලික ආදායමක් හෝ මහජන මූල්‍ය මත රඳා පවතින් මහජන ආරක්ෂණ දැලක් තුළින් හිමිවන ආරථික ස්ථායීතාවය මානව සුරක්ෂිතතාවගේ පළමු අංගය වන ආර්ථික සුරක්ෂිතතාවය සඳහා අත්‍යාවශ්‍ය වන බව 1994 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ වාර්තාව දක්වා සිටියි.[59] අවිනිශ්චිත ශ්‍රමය ප්‍රතිඵල කරන ශ්‍රම සැකසුම් විසින් අහිමි කරන්නේ මෙම ආර්ථික ස්ථායීතාවය යි.

> "කර්මාන්තයන්ගේ සිදුවන ව්‍යුහාත්මක වෙනස්කම් තුළ අවිනිශ්චිත ශ්‍රමය කරා වන ගෝලීය විතැන්වීම නිරූපනය වේ.

56. Declaration on the Right to Development, www.un.org, ප්‍රවේශය දෙසැම්බර් 16, 2018, http://www.un.org/documents/ga/res/41/a41r128.htm.

57. The Rio Declaration on Environment and Development, www.unesco.org, ප්‍රවේශය දෙසැම්බර් 16, 2018, http://www.unesco.org/education/pdf/RIO_E.PDF.

58. දෙසැම්බර් 16, 2018, http://www.un.org/ga/search/view_doc.asp?symbol=A/RES/70/1&Lang=E.

59. Human Development Report 1994, United Nations Development Programme (UNDP) Oxford: Oxford University Press, 1994, 22.

> ඊකියාවන් වඩ වඩා තාවකාලික හා අර්ධ කාලීන ස්වරූපයක් ගනු ලබන අතර ඊට ඇති වෘත්තීය සමිති ඊකවරණය හින වී යයි."[60]

ඇත්තවශයෙන්ම වර්තමානයේ මානව හිමිකම් විරෝධී ජනප්‍රියවාදී කතිකාවේ තර්කය මේ වන විට ද යල්පිනූ එකකි. නමුත් මෙවැනි තර්ක බටහිර මෙන්ම ප්‍රාග්ධනයේ පරිවාරයේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාව වැනි සමාජයන් තුළ ද තවමත් බෙහෙවින් වලංගු තර්කයක් ලෙස ඉදිරිපත්වීම අතිශය සුලභය. මෙයට එක් හේතුවක්ව ඇත්තේ සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සඳහා මානව හිමිකම් කතිකාවේ හිමිව ඇති අධිපතිත්වය යි. පිලිප් ඇල්ස්ටන්ට අනුව සමාජීය ප්‍රභූන් බොහෝ විට සිවිල් සහ දේශපාලනික අයිතිවාසිකම් සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන්නේ ස්වකීය වරප්‍රසාදිත තත්ත්වය හේතුකොටගෙන ඔවුන්ගේ ආර්ථික සහ සමාජීය අයිතිවාසිකම් ප්‍රබල ලෙස අභියෝගයන්ට ලක් නොවන බැවිනි.[61] නමුත් වරප්‍රසාදිත ප්‍රභූ කවයන්ගෙන් පිටත සිටින බහුතර ජනතාව මුහුණ දෙන ප්‍රධාන මානව හිමිකම් අභියෝගයන් නිර්මාණය වන්නේ ඔවුන්ගේ ආර්ථික සහ සමාජීය ආයිතිවාසිකම් ක්ෂේත්‍රයේය.[62] මේ සන්දර්භය තුළ ස්වකීය ආර්ථික හා සමාජීය අයිතිවාසිකම් අරගලයන් තුළ දී මෙකී නිර්ප්‍රභූ කණ්ඩායම් විසින් අත්හදා බලන නව ප්‍රවේශයන් හා උපායමාර්ග බරපතල ලෙස සැලකිල්ලට ගැනීම වැදගත්ය. ඊට හේතුව මානව හිමිකම් පිළිබඳ සංකල්පීකරණයන් පුළුල් කිරීම තරමටම කම්කරු අරගල සම්බන්ධයෙන් වන සාම්ප්‍රදායික ප්‍රවේශයන් රැඩිකල්කරණයට ලක්කිරීම ද වැදගත් වන බැවිනි.

---

60. එම, 25.

61. Phillip Alston. "The Populist Challenge to Human Rights." in Journal of Human Rights Practice, Volume 9, Issue 1, (2017): 13.

62. Virginia Bras Gomes, "Beyond civil and political rights: Economic, social and cultural rights are human rights too," Interview by Vidura Prabath Munasinghe, LST Review Vol.9 Issue 346. (Colombo: Law & Society Trust, 2018), 27-32.

## සහකම්පනය සහ සහෝදරත්වය

ටෙලිකොම් මැන්පවර් අරගලය මුල් අවස්ථාවේදී (කලින් ද විස්තර කළ පරිදි) කිසියම් ආකාරයකට දේශපාලනඥයින් මත යැපෙන ස්වරූපයක් පෙන්නුම් කළ ද, පසුව විවිධ ප්‍රගතිශීලී පාර්ශවයන්ගේ සක්‍රිය මැදිහත් වීම සමඟ එය බහුවිධ ක්‍රියාකාරීන්ගෙන් සැදුම්ලත් අරගලයක් බවට පත් විය. මෙකී මැදිහත්වීම් ඔස්සේ තීව්‍ර සටන්කාමී අවකාශයක් නිර්මාණය කරන ලද අතර එය දිවයිනේ ඒ වන විට පැවති අනෙකුත් අයිතිවාසිකම් පිළිබඳ අරගල හා සම්බන්ධ වන අවස්ථාවන් ද එහිදී දැක ගත හැකි විය. උදාහරණයක් ලෙස ඒ වන විට පැවති කොළඹ අන්තර්ජාතික මූල්‍ය නගරය (වරාය නගරය යනුවෙන් පොදු ව්‍යවහාරයේ හඳුන්වනු ලබන)[63] ඉදිකිරීමෙන් පාරිසරික සහ ආර්ථිකමය තර්ජයනයට ලක් වන ජනතාව විසින් සංවිධානය කරමින් පැවති විරෝධතාවයන් සඳහා වූ මූලික සාකච්ඡාවන්ට ටෙලිකොම් මැන්පවර් කම්කරුවන් සහභාගී වූ අතර යුධ කාලය තුළ රජය විසින් අත්පත් කරගත් යාපනයේ ඉඩම් ඉල්ලා එහි වැසියන් සිදු කරන ලද උද්ඝෝෂණයන්ට ද ඔවුහු සහභාගී වූහ.[64] වැඩවර්ජනයේ නිරත වීම හේතුවෙන් (අප ඉහත විස්තර කළ අවිනිශ්චිත ශ්‍රමයේ ස්වභාවය) තමන්ගේ ආර්ථිකය කඩා වැටීමට ලක් වූ කම්කරුවන් වෙත විවිධ අයිතිවාසිකම් අරගලයන්හි නිරතව සිටි පිරිස් වෙතින් සහයෝගය

---

63. කොළඹ අන්තර්ජාතික මූල්‍ය නගරය, කොළඹ වරායට යාබදව මුහුද ගොඩකිරීමෙන් ඉදිරිකිරීමට නියමිත හෙක්ටෙයාර 262 ක විශේෂ ආර්ථික කලාපයකි. මෙම ව්‍යාපෘතිය විවිධ හේතු නිසාවෙන් විවිධ පාර්ශ්වයන්ගේ විවේචනයට ලක්ව ඇත. එමඟින් පාරිසරික ගැටලු රැසක් ඇතිවේ යැයි පරිසරවේදීහු අනතුරු අඟවා සිටිති. 2014 වසරේදී එහි ආරම්භක අදියරේ මුහුදු ගොඩකිරීම් ඇරඹීමත් සමඟ කොළඹ වරායට උතුරින් පිහිටි මුහුදු තීරයේ ධීවර කටයුතුවල නිරත වන්නන්ගේ ජීවිකාවට බලවත් පහරක් එල්ල විය. නව භූමිය නිර්මාණය වීමක් සමඟ එහි සිට කි. මී. 75 ක් දක්වා විහිදෙන වෙරළ තීරයක් දරුණු සමුද්‍ර ඛාදනයකට ගොදුරු විය.

64. එල්. හේමචන්ද්‍ර, සම්මුඛ සාකච්ඡාව, ජූලි 3, 2018.

ලැබීමට පටන් ගත්තේ මෙකී සහෝදරාත්මක ජාලකරණයේ ප්‍රතිඵලයක් වශයෙනි. උමා ඔය ව්‍යාපෘතිය[65] හේතුවෙන් තම ගොවිබිම් තර්ජනයට ලක් වූ ගොවීහු තම එළවළු අස්වනු ද, වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් තම ජීවන වෘත්තීය අභියෝගයට ලක්වුනු ධීවරයෝ තම මත්ස්‍ය අස්වැන්න ද මෙම කම්කරුවන් වෙනුවෙන් නොමසුරුව පරිත්‍යාග කළහ. අජිත් කුමාරසිරි වැනි විකල්ප කලා කරුවන් මහපාරේ අරගල භූමිය වෙත පැමිණ ඔවුන් දිරිගන්වමින් ගීත ගායනා කළහ.[66] දින 87 ක් පුරාවට මෙම අරගලය අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය ශක්තිය සහ තීව්‍රත්තවය නිර්මාණය වූයේ මෙම සහෝදරත්වය තුළිනි.

කොළඹින් බැහැර බහුවිධ කණ්ඩායම් වල මැදිහත් වීම නොලැබුණු මාගම්පුර වරායේ මැන්පවර් අරගලය තුළ ද (මෙම සේවකයන් බඳවා ගැනීමේදී මෙන්ම මෙම අරගලයේ මුල සිටම පැවති දේශපාලන පක්ෂ පක්ෂපාතීත්වය බාහිර සහෝදරාත්මක මැදිහත්වීම් සීමා කරවන්නක් විය) හැකිතාක් දුරකට තම සෘජු දේශපාලන සම්බන්ධකම් හුවා නොදක්වමින් පොදු අරගලයක ස්වරූපයක් අත් කර ගැනීමට උත්සහ කළ බව එහි සක්‍රීය ක්‍රියාකාරිකයෙකුව සිටි අයෙකු අප හා පැවසීය. පැවති රජයේ දේශපාලන බලකඳවුරක ක්‍රියාත්මක වුවද මෙම අරගල බිම වෙත ඔවුන් සෘජුවම කැඳවා නොගැනීමටත්, අරගල මොහොතේ ඔවුන්ගේ ආධාර ලබා නොගැනීමටත් (නඩු කටයුතු සඳහා වන නීති ආධාර හැර) ඔවුහු ප්‍රවේශම් වූහ. තමන්ට ආර්ථික අසීරුතා වැඩි

65. උමා ඔය ව්‍යාපෘතිය යනු බණ්ඩාරවෙල ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ බහු කාර්ය ව්‍යාපෘතියකි. මේ යටතේ ජල විදුලි බලාගාරයක් සඳහා වන කි. මී. 3.35 ක් දිගු උමඟක් කැනීම 2014 දෙසැම්බර් මාසයේදී ආරම්භ විය. දින කිහිපයක කැනීම්වලින් අනතුරුව භූගත ජලය උමඟ තුළට කාන්දුවීම ඇරඹුනු අතර එහි ප්‍රතිඵලයක් ලෙස උමඟට ඉහලින් භූමිය ගිලාබැසීමට ලක්වීමම හේතුවෙන් නිවාස 7,000 කට පමණ අලාභහානි සිදුවිය. තවද භූගත ජලය සිඳී යාම නිසා වගා බිම් විශාල ප්‍රමාණයක් අත්හැර දැමීමට ද සිදු විය. මේ ක්ෂණික ආපදාවට එරෙහිව ප්‍රබල මහජන විරෝධයක් මතුව ආ අතර ඔවුහු 'උමා ඔය බහු විනාශකාරී ව්‍යාපෘතියට එරෙහි ජනතා පෙරමුණ' ලෙස ඊට එරෙහිය විරෝධතා ව්‍යාපාර දියත් කළහ.

66. කේ. කෝට්ටෙගොඩ, සම්මුඛ සාකච්ඡාව, ජුනි 27, 2018.

වැඩියෙන් දැනෙන විට ඔවුන් තෝරාගත් ක්‍රියාමාර්ගය වූයේ මාගම්පුර වරාය අවට ප්‍රදේශවල, සූරියවැව හම්බන්තොට, වළස්මුල්ල වැනි ප්‍රදේශයන්හි සති පොළවලට ගොස් තම අරගලය පිළිබඳ වෙළඳුන් හා ජනතාව දැනුවත් කරමින් ඔවුන්ගේ සහය ඉල්ලා සිටීමයි.[67]

රත්මලාන ඇසෝසියේටඩ් බැටරි මැනුෆැක්චර්ස් හි මැන්පවර් අරගලයේදී මැන්පවර් කම්කරුවන්ට සහය දක්වමින් ස්ථිර කම්කරුවන් ද වැඩවර්ජනයට එක්වීම සුවිශේෂී වේ. බොහෝ ආයතන මැන්පර් සහ ස්ථිර යන කම්කරුවන් දෙවර්ගයම ආයතනයක් තුළ පවත්වා ගන්නේ යම් හෙයකින් එක් පිරිසකගේ වෘත්තීය අරගලයක් හේතුවෙන් නිෂ්පාදන කටයුතු අඩාල වුවහොත් ඉතිරි පිරිස මගින් නිෂ්පාදන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහාය. මේ නිසා මැන්පවර් කම්කරුවන් කමන්ගේ වරප්‍රසාද වලට තර්ජනයක් බවට වන සිතීම දිගින් දිගටම ස්ථිර කම්කරුවන් තුළ ප්‍රවර්ධනය කෙරෙන අතර තමන්ට වඩා සාපේක්ෂව වැඩි පඩි, වරප්‍රසාද, වෘත්තීය අයිතිවාසකම් සහ සාපේක්ෂව පහසු වැඩ තත්වයන්ට හිමිකම් කියන ස්ථිර සේවකයන් පිළිබදව වන කිසියම් ආකාරයක එදිරිවාදීත්වයන් මැන්පවර් කම්කරුවන් තුළ පවතී. නමුත් මෙම අරගලයේදී මෙම සේවක දෙපිරිසේ එක්සත් වීම සුවිශේෂී විය.

පොදුවේ ගත් කළ මෙම අරගල ත්‍රිත්වයේ පැවති රැඩිකල් ප්‍රවේශයන් හා උපාමාර්ගයන් පිළිබඳව සැළකීමේදී එකී අරගල සමහරකු වෙතින් ප්‍රකාශයට පත්වූ ආකාරය තුළ අයිතිවාසිකම් පිළිබඳ අරගලයක් දේශපාලනය විසින් යටපත් කිරීමේ කතාන්තරයකට වඩා වැඩි යමක් පවතින බවක් පෙනී යයි. මේ පිළිබදව ස්වයං විවේචනාත්මක වෙමින් ටෙලිකොම් මැන්පවර් අරගලයට සක්‍රීයව සම්බන්ධ වූ ආර්ථික ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වූ සන්ධානයේ ක්‍රියාකාරිනියක වූ ලක්මාලි හේමචන්ද්‍ර මෙසේ පැවසුවාය.

67. සාගර, සම්මුඛ සාකච්ඡාව, ජුලි 22, 2018.

"මිනිස්සු අපි හිතනවට වඩා රැඩිකල් නමුත් ඒක යම් නිශ්චිත අරගල භූමියකින් පිටතට යන්නේ නැහැ. අරගල භූමියේ සටන්කාමීත්වය තුළ පමණයි සහකම්පනය සහ අරගලය තියෙන්නේ. අරගල අවකාශයෙන් පිටත මෙම අරගලකාරී බව නැහැ."[68]

මෙය බොහෝ විට අයිතිවාසිකම් පිළිබඳ අරගල අවසානයේ ප්‍රකාශයට පත්වන පොදු හැඟීමකි. මීට පෙර වසරවල ක්‍රියාත්මක වූ උමාඔය අරගලය, රතුපස්වල ජල අරගලය[69] සහ පානම ඉඩම් අරගලය[70] වැනි අරගල අවකාශයන්හිදී අතිශය රැඩිකල් භාවිතාවක් පෙන්වූ ජනතාව එකී අරගල අවකාශ වලින් පිටත එවැන්නක් නිරූපණය කළේ නැත.[71]

## මෙතැනින් ඔබ්බට.....

ප්‍රබලව ඉදිරිපත්වෙමින් පවත්නා මානව හිමිකම් විරෝධී ජනප්‍රියවාදී තර්කයන් විසින් සිදුකරන්නේ පරමාධිපත්‍ය හිමි ජනතාවගේ හෝ ඔවුන්ගේ නියෝජිතයින්ගේ නියාමනයෙන් තොරවූ කිසිදු

---

68. එල්. හේමචන්ද්‍ර, සම්මුඛ සාකච්ඡාව, ජූලි 3, 2018.

69. ගම්පහ දිස්ත්‍රික්කයේ වැලිවේරිය-රතුපස්වල ප්‍රදේශවල ග්‍රාමසේවා වසම් 28 ක භූගත ජලය එම ප්‍රදේශයේ පිහිටි රබර් අත්වැසුම් කර්මාන්ත ශාලාවක රසායන ද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන අපවිත්‍රව ඇති බවට සොයා ගැනීමත් සමඟ 'සියනෑ පරිසරය සුරැකීමේ ව්‍යාපාරය' ලෙස සංවිධානය වූ ජනතාව, එම කර්මාන්ත ශාලාව ප්‍රදේශයෙන් ඉවත් කරන ලෙස බලකරමින් විරෝධතා ව්‍යාපාරයක් ආරම්භ කළහ. 2013 අගෝස්තු 01 වන දින එම ව්‍යාපාරය විසින් සංවිධානය කළ විරෝධතාවයකට හමුදාව සිදුකළ පහර දීමකින් තරුණයින් 3 දෙනෙකු මරණයට පත්වූ අතර 50 ක් පමණ තුවාල ලැබූහ. පසුව කර්මාන්ත ශාලාව ප්‍රදේශයෙන් ඉවත් කරනු ලැබුණි.

70. 2010 වසරේදී අම්පාර දිස්ත්‍රික්කයේ පානම ප්‍රදේශයේ වසර 40 කට වැඩි කාලයක් ගොවිතැන් කටයුතුවල නිරත වූ ගොවීන් 350 ක් පමණ රජය විසින් බලහත්කාරයෙන් ඔවුන්ගේ ගොවි බිම් වලින් ඉවත් කරනු ලැබින. මුලින් එහි අරමුණ එම භූමියේ හමුදා ස්ථාපිතයන් ඉදිකිරීම යැයි පැවසුනද පසුව එම ඉඩම් සංචාරක කර්මාන්තය සඳහා යොදා ගැනීමට රජය තීරණය කළේය. ඉඩම් අහිමි වූ ගොවීහු 'පානම්පත්තුව සුරැකීමේ සංවිධානය' නමින් සංවිධානය වී තම ගොවි බිම් ඉල්ලා උද්ඝෝෂණ ව්‍යාපාරයක් ආරම්භ කළහ.

71. Vidura Munasinghe. "Waiting for Mahinda mahaththaya: 2018 Local Government Election". In LST Review Vol. 29 Issue 345. (Colombo: Law & Society Trust, 2018), 10-19.

ප්‍රජාතන්ත්‍රවාදයක්, වගවීමක් හෝ විනිවිදභාවයක් නොමැති ආර්ථික ඒකාධිකාරයක පැවැත්මට අවශ්‍ය තත්ත්වයන් නිර්මාණය කිරීමය. අනෙක් අතට එකී ආර්ථික ඒකාධිකාරය තුළ ක්‍රියාත්මක වන නියාමනහරණය (deregulation) සහ නම්‍යශීලී සංකේන්ද්‍රණය (flexible accumulation) විසින් වඩ වඩාත් ජනතාවගේ ආර්ථික හා සමාජීය අයිතිවාසිකම් අර්බුදයට ලක්කරමින් පවතී. මෙහිදී අපගේ අවධානයට ලක්වූ මැන්පවර් අරගල ත්‍රිත්වය තුළම නිරූපනය වූයේ මෙම යථාර්ථයයි. මානව හිමිකම්වලට එරෙහි ජනප්‍රිය ජාතික ආරක්ෂාවේ තර්කය තවදුරටත් වලංගු වන්නක් නොවේ. ජනතාවගේ ආර්ථික අයිතිවාසිකම් සුරක්ෂිත නොවන තත්ත්වයක මානව සුරක්ෂිතතාවය අර්බුදයට යයි. මේ තත්ත්වය තුළ මානව හිමිකම් පිළිබඳ ලිබරල් ප්‍රභූ කතිකාවේ අඩු වැදගත්කමක් හිමිවන ආර්ථික හා සමාජීය අයිතිවසිකම් අරගලය න්‍යායපත්‍රයේ පෙරමුණට ගෙන ඒම වැදගත් වේ. මානව හිමිකම් යනු අඛණ්ඩ අරගල බිමක් ලෙස වටහා ගැනීමත්, බහුවිධ අයිතිවාසිකම් කඩවීම්වලින් පීඩා විඳින්නන් අතර වන සහෝදරාත්මක ජාලගතවීමත් මෙහිදී වැදගත්ය. එමෙන්ම මානව හිමිකම් සුරක්ෂිත කිරීම යනු සමාජයේ සියළු ආකාරයේ විෂමතාවන් පිටුදැකීමෙන් තොරව මිස සාක්ෂාත් කරගත හැක්කක් නොවන බවට අර්ථ ගන්වා ගැනීමත්, ඒ ඔස්සේ බහුවිධ අයිතිවසිකම් අරගලයන් අතර ජාලකරණයත් වැදගත්වේ. අරගල අවකාශයෙන් පිටතට සහකම්පනය හා අරගලය ගෙනයා හැක්කේ එමඟිනි. ■

## ආශ්‍රිත ග්‍රන්ථ

Alston, Phillip. “The Populist Challenge to Human Rights.” In Journal of Human Rights Practice, Volume 9, Issue 1, 1-15. Oxford: Oxford University Press, 2017.

Coomaraswamy, Radhika. “International Human Rights: Dispelling the Myths,” https://groundviews.org, accessed November 15, 2018. https://groundviews.org/2014/08/28/international-human-rights-dispelling-the-myths-by-radhika-coomaraswamy/

Counter Terrorism Bill, The Gazette of Democratic Socialist Republic of Sri Lanka, Part II of September 14, 2018, Sec. 15.3 (2). (d), (g), (h). Accessed October 18, 2018. http://www.documents.gov.lk/files/bill/2018/9/528-2018_E.pdf

Edgell, Stephen. Sociology of Work: Continuity and Change in Paid and Unpaid Work, London: Sage Publications, 2006, 1-27.

Gomes, Virginia Bras' “Beyond civil and political rights: Economic, social and cultural rights are human rights too,” Interview by Vidura Prabath Munasinghe, LST Review Vol.9 Issue 346, Colombo: Law & Society Trust, 2018, 27-32.

Gunduz, Canan. Human Rights and Development: The World Bank’s Need for a Consistent Approach, London: London School of Economics, 2004.

Harvey, David. *A Brief History of Neo-Liberalism*, Oxford: Oxford University Press, 2006.

Harvey, David. Neoliberalism and Restoration of class power. Accessed September 22, 2018, https://gsnas.files.wordpress.com/2007/10/harvey080604.pdf.

Harvey, David. "Spaces of Neo-Liberalism: Towards a Theory of Uneven Geographical Development," Hettner Lecture 2004, Franz Steiner Verlag, 2005, https://d-nb.info/974905585/04.

Human Development Report 1994, United Nations Development Project, Oxford: Oxford University Press, 1994.

Lee, Timothy B. "Brexit: the 7 most important arguments for Britain to leave the EU,"www.vox.com, accessed November 15, 2018, https://www.vox.com/2016/6/22/11992106/brexit-arguments.

Munasinghe, Vidura. "Waiting for Mahinda mahaththaya: 2018 Local Government Election". In LST Review Vol. 29 Issue 345. Colombo: Law & Society Trust, 2018), 10-19.

Munasinghe, Vidura. Reimagining *'The Worker' and Resistance in the Neo-Liberal Era*. Colombo: Law & Society Trust, 2018.

Colombo Magistrate Court Case No. B 4132/16.

Colombo District Court Case No. Case No. 3/2017/DSP.

Daily News. "Sri Lanka Telecom files a writ petition against Police inaction over manpower employees", accessed October 20, 2018, http://www.dailynews.lk/2017/03/24/law-order/111439/sri-lanka-telecom-files-writ-petition-against-police-inaction-over.

Pressreader.com. Several petitions have been filed by different parties challenging the Counter Terrorism Bill which was tabled

in the Parliament on 9th October 2018. “Counter Terrorism Bill Challenged in SC”, https://pressreader.com, accessed November 11, 2018, https://www.pressreader.com/sri-lanka/sunday-times-sri-lanka/20181021/281569471706302

Newsfirst.lk. “Hambanthota Port employees continue strike action”, accessed October 06, 2018. https://www.newsfirst.lk/2016/12/09/hambantota-port-employees-continue-strike-action/

Roar.media. “What happened in Hambanthota”. Accessed October 07, 2018. “https://roar.media/english/life/reports/what-happened-in-magampura/

slt.lk. Sri Lanka Telecom, http://slt.lk, accessed November 11, 2018, http://www.slt.lk/en/about-us/profile/subsidaries.

Sundayobsever.lk. “Attack on Hambanthota port workers: state minister rejects allegations”. Accessed October 06, 2018. http://www.sundayobserver.lk/2016/12/11/news/attack-hambantota-port-workers-state-minister-rejects-allegations

Sundayobsever.lk. “Enjoying order against SLT trade union protests”, Accessed October 18, 2018, http://www.sundayobserver.lk/2017/01/15/business/enjoining-order-against-slt-trade-union-protests?page=1

The Gazette of Democratic Socialist Republic of Sri Lanka. Counter Terrorism Bill, Part II of September 14, 2018, Sec. 15.3 (2). (d), (g), (h). accessed October 18, 2018. http://www.documents.gov.lk/files/bill/2018/9/528-2018_E.pdf

un.org. Declaration on the Right to Development. accessed on December 6, 2018, http://www.un.org/documents/ga/res/41/a41r128.htm

unesco.org. The Rio Declaration on Environment and Development, accessed on December 6, 2018, http://www.unesco.org/education/pdf/RIO_E.PDF

un.org. Resolution adopted by General Assembly on 25 September 2015, accessed on December 6, 2018. http://www.un.org/ga/search/view_doc.asp?symbol=A/RES/70/1&Lang=E

worldmaritimenews.com. "Sri Lanka Navy breaks up protests at Hambanthota Port," accessed November 16, 2018, https://worldmaritimenews.com/archives/208445/sri-lanka-navy-breaks-up-protests-at-hambantota-port/

**අනුග්‍රහය**

FORD FOUNDATION

diakonia
PEOPLE CHANGING THE WORLD

ISBN 978-955-1302-80-1